උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

31345

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - **2024**

S 3

පැය තුනයි

(03) අභිධර්මය

අතිරේක කියවීම් කාලය විනාඩි 10යි.

- **I** කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු සමඟ අමුණා භාරදෙන්න.

gyakody
Commissioner of Examinations
Confidential (I/E)
Department of Examinations, Sri Lanka.
Pelawatta, Battaramulla.

විභාග අංකය .....

I කොටස

1. (i) අභිධර්මය පරමාර්ථ දේශනා වශයෙන් හඳුන්වන්නේ කුමන හේතුව නිසා දැ යි පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(ii) ප්‍රතිසංඛ්‍ය නිරෝධය, අප්‍රතිසංඛ්‍ය නිරෝධය සහ ආකාශ යන අසංස්කෘත ධර්ම තුනක් දක්වන අභිධර්ම සම්ප්‍රදාය කුමක් දැ යි නම් කරන්න. *(ලකුණු 02 යි)*

.....

.....

.....

(iii) අභිධර්ම පිටකය සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙන් කවර ප්‍රමාණයක් නියෝජනය කෙරේ දැ යි දක්වා, එම පිටකයට අදාළ සුවිශේෂ ලක්ෂණ දෙකක් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

.....

(ආ) .....

.....

(iv) ලොව ඇති ධර්ම සියල්ල නිරවශේෂ වශයෙන් බෙදා දක්වන අභිධර්ම පිටකයෙහි එම ධර්ම හඳුන්වා දී ඇති සිව්වැදෑරුම් ආකාරය නම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(v) දොළොස් අකුසල් සිත් අතුරින් කිසිවිටෙකත් ප්‍රතිසන්ධි විපාක ලබා දීමට සමත් නොවන අකුසල සිත කුමක් දැ යි දක්වා ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

.....

.....

.....

.....

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(vi) විඤ්ඤත්ති රූප දෙක පිළිවෙලින් නම් කරන්න. එයින් දෙවැන්න කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

.....

.....

.....

(vii) මහා භූත රූප පිළිවෙලින් නම් කරන්න. ඒවා මහා භූත රූප ලෙස හැඳින්වීමට හේතුව පහදන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

.....

.....

.....

(viii) සතර වැදැරුම් වාචසික අකුසල පිළිවෙලින් ලියන්න. එයින් පළමු වැන්න හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

.....

.....

.....

(ix) සංඛත ධර්මයන්ට අදාළ සුවිශේෂී ලක්ෂණ තුන ලියන්න. එයින් දෙකක් හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

.....

.....

.....

.....

(x) ප්‍රඥා ශික්ෂාව සාධනය කර ගැනීමට පූර්වගාමීව සම්පූර්ණ කළ යුතු ශික්ෂා දෙක නම් කර හැඳින්වීම් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) .....

(ආ) .....

.....

.....

.....

.....

* *

Past Papers Wiki

දක්කරා පමු පරීක්ෂකවරුන්ගේ
ප්‍රයෝජනය සඳහා පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 3

(03) අභිධර්මය

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) (අ) රූපාවචර පළමු කුසල සිත ලියන්න. *(ලකුණු 01 යි)*

(ආ) එය ධ්‍යානයක් ලෙස හැඳින්වීමට හේතු දෙකක් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) පඨමධ්‍යාන කුසල චිත්තය සමථ භාවනාව තුළින් ලැබෙන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නොපිරිහුණු පඨමධ්‍යාන විපාක සිතින් ලබන ප්‍රතිසන්ධිය පිළිබඳව පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

2. (i) (අ) දෙපනස් චෛතසික බෙදෙන මූලික ප්‍රභේද තුන නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ප්‍රභේදවලට අයත් චෛතසික සංඛ්‍යාව දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) විරති චෛතසික පිළිවෙලින් නම් කර, විරති යන්න පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ලෞකික වශයෙන් යහපත් සමාජ සබඳතාවක් පැවැත්වීමට පුද්ගලයා කෙරෙහි විරති චෛතසිකයන් බලපාන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

3. (i) (අ) චිත්ත වීථීන් හි මූලික ප්‍රභේද දෙක නම් කර, ඒවා හඳුන්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) චිත්ත වීථියක පවත්නා සතළොස් චිත්තක්ෂණ එකක් නැවත කුඩා ක්ෂණ තුනක් ලෙස බෙදේ. එම ක්ෂණ තුන පිළිවෙලින් නම් කර, ඒවා හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) ජවිභා ද්වාරික අති මහන්තාරම්මණ චිත්ත වීථි සටහන දක්වා, සම්පටිච්චන, සන්තීරණ, වොත්තපන කෘත්‍ය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) අති මහන්තාරම්මණ චිත්ත වීථියක පවත්නා මූලික ලක්ෂණ හතරක් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

4. (i) (අ) ගබ්භ සෙය්‍යක සත්ත්වයන් හඳුන්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) අටවිසි රූප බෙදෙන ප්‍රධාන ප්‍රභේද දෙක නම් කර, එක් එක් ප්‍රභේදයට අයත්වන රූප සංඛ්‍යාව දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) ලක්ඛණ රූප පිළිවෙලින් නම් කර, ඒවා පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ආහාර රූපය හඳුන්වා, පුද්ගලයාගේ සමාජ ජීවිතය සංවර්ධනයට ලෞකික වශයෙන් එය බලපාන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

5. (i) (අ) සතර බ්‍රහ්ම විහාර පිළිවෙලින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) තෙවැනි බ්‍රහ්ම විහාරය හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) පංච අභිඥා පිළිවෙලින් නම් කරන්න. ඒවා සාධනය කර ගැනීම සිදුවන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මෛත්‍රිය වඩන ආකාරය හා මෛත්‍රිය වැඩීමේ ප්‍රතිඵල දක්වමින් මෛත්‍රී භාවනාව පිළිබඳව විස්තරයක් කරන්න. *(ලකුණු 07 යි)*

PAST PAPERS WIKI

[හතරවැනි පිටුව බලන්න.

මෙතනින් කපා ඉවත් කරන්න

6. (i) (අ) "කර්ම" යන්න ධර්මානුකූලව අර්ථ දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) "විපාක" යන්න ධර්මානුකූලව අර්ථ දක්වන්න *(ලකුණු 03 යි)*

(ii) කර්මයෙන් කෙරෙන කෘත්‍ය සතර පිළිවෙලින් නම් කර, ඒ පිළිබඳව හැඳින්වීම් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "සමාජගත පුද්ගලයාට කර්මයට පමණක් නොව නියාම ධර්මයන් සියල්ලටම මුහුණදීමට සිදුවේ." පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

7. (i) (අ) මිනිස් සිතේ කෙලෙස් ක්‍රියාත්මක ආකාරයන් තුන නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) සප්ත අනුසය ධර්ම අතරින් භතරක් නම් කර, අනුසය යන්න හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) ත්‍රි ශික්ෂාව මගින් මේ ක්ලේශ ධර්ම ප්‍රහීණය කෙරෙන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "ත්‍රි ශික්ෂාව නිවන් මාර්ගයයි". විමසන්න. *(ලකුණු 07 යි)*

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library